**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2024**
**(කලාප මට්ටමේ ලිඛිත තරග)**

1. අපේක්ෂකයාගේ නම : ..............................................
   (මුල්'කුරු සමඟ නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ..............................................
3. පාසල් වර්ගය (200 තෙක්/ 201 - 500 තෙක්/ 500 ට වැඩි) ..............................
4. කලාපය : ..............................
5. පළාත : ..............................

**12, 13 ශ්‍රේණි** | **පද්‍ය නිර්මාණ හා අවබෝධය** | **කාලය පැය 02**

- පළමුවන කොටසට අයත් **සියලු ම ප්‍රශ්නවලට** පිළිතුරු සපයන්න.
- දෙවන කොටසේ (අ), (ආ) කොටස් දෙකෙන් **එක් ප්‍රශ්නයකට පමණක්** පිළිතුරු සපයන්න.
- ඔබගේ පිළිතුරු පත්‍රය සමග ප්‍රශ්න පත්‍රය ද අමුණා එවිය යුතු ය.

## I කොටස

(01) පහත දැක්වෙන ඡේද ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) ''වර්ණය'' යනු අපට එක් වරකට උච්චාරණය වන ශබ්දයෙහි දිග ප්‍රමාණය වේ. එබැවින් එය මාත්‍රා එකකින් මෙන් ම දෙකකින් ද යුක්ත විය හැකි ය. එක් මාත්‍රාවක ඇති 'ම' යන්න මෙන්ම මාත්‍රා දෙක බැගින් ඇති 'මා' නොහොත් 'අන්' යනු ද වර්ණයකි. මේ අනුව 'කුසුම' යන පදයෙහි මාත්‍රා මෙන්ම වර්ණ ද තුනක් ඇත. 'කුසුමා' යන පදයෙහි මාත්‍රා සතරකි. එහෙත් වර්ණ තුනකි. 'මල් දම් වන්' යන තන්හි මාත්‍රා සයක් ඇතත්, එහි ඇත්තේ ද වර්ණ නම් තුනකි.

ආලංකාරිකයෝ මෙවැනි වර්ණ ගණයක් සේ ගනිති. වර්ණ තුනක් සංයෝග විය හැක්කේ අට ආකාරයකට පමණක් බැවින් ගණ අටක් ලැබේ. එළු සඳැස් ලකුණ ඒ ගණ අට මෙසේ හඳුන්වයි.

''මන තුන් තුන් ගුරු ලුහු - බදස ඈ මැද කෙළ ගුරු
සරතැ මැදවසන් ලුහු - අට ගණ මෙසේ දන්නේ''

ගීයෙන් කියැවෙන අන්දමට ගණ අටෙහි නම් හා ප්‍රස්තාර මෙසේයිඃ

ම - මාත්‍රා 6 යි
න - මාත්‍රා 3 යි
බ - මාත්‍රා 4 යි
ය - මාත්‍රා 5 යි
ජ - මාත්‍රා 4 යි
ර - මාත්‍රා 5 යි
ස - මාත්‍රා 4 යි
ත - මාත්‍රා 5 යි

i. මෙහි දැක්වෙන පරිදි 'වර්ණය' යනු කුමක් ද?
..............................................................................................

ii. 'වර්ණයක්' මාත්‍රා කීයකින් යුක්ත විය හැකි දැයි දක්වන්න.
..............................................................................................

iii. 'මල් දම් වන්' යන යෙදුමේ මාත්‍රා හා වර්ණ ගණන කොපමණදැයි වෙන වෙනම ලියන්න.

.......................................................................................................................................

iv. ආලංකාරිකයෝ ගණයක් ලෙස හඳුන්වන්නේ මොනවා ද?

.......................................................................................................................................

v. ගණ අටට අයත්වන වර්ණ සඳහන් කරන්න.

.......................................................................................................................

(ලකුණු 1 X 5 = 5)

(ආ) ගී කාව්‍යයන්හි එන බස් වහර කෙසේ වෙතත් ගී විරිත් නම් අධික ශබ්ද රසයෙන් පිරී ගිය සිවුපද විරිත්වලට වඩා පද්‍ය සඳහා සුදුසු බව පෙනේ. ගී විරිතෙහි ද සිවුපද විරිතෙහි දී මෙන් පාද සම කිරීමක් හෝ එළිසම පිහිටුවීමක් අවශ්‍ය නොවන බැවින් ගී විරිතින් පද්‍ය රචනා කිරීම වඩා පහසු ය. එළිසම පිහිටුවා සිව්පද රචනා කිරීමේ දී මාත්‍රා පූර්ණය සඳහා අනවශ්‍ය පද යෙදීමට ද, හ්‍රස්වාක්ෂර දීර්ඝ කිරීමට ද, දීර්ඝාක්ෂර හ්‍රස්ව කිරීමට ද සිදු වෙයි. එළිවැට තැබීම සඳහා ද පාද විකෘති කිරීමට සිදු වෙයි. භාෂණයේ එන ස්වාභාවික රිද්මය ද මේ අනුව විකෘති වේ. එපමණක් නොව සිවුපද විරිත්වල ඇති අධික ශබ්ද රසය විසින් ඒ රිද්මය යටපත් වී ද යයි. ගී විරිත වඩා නිදහස් බැවින් භාෂණයේ එන රිද්ම අඩපණ නොකොට බොහෝ දුරට එලෙස ම ආරක්ෂා කර ගැනීමට ද පුළුවන.

i. ගී විරිත පද්‍ය රචනා කිරීම සඳහා පහසු යැයි මේ ලේඛකය තීරණය කරන්නේ ඇයි?

.......................................................................................................................................

ii. එළිවැට පිහිටුවා සිව්පද රචනා කිරීමේදී මාත්‍රා පූරණය සඳහා සිදුකරන්නේ කුමක් ද?

.......................................................................................................................................

iii. භාෂණයේ එන ස්වාභාවික රිද්මය වීකෘති වීමට හේතුවන්නේ කුමක් ද?

.......................................................................................................................................

iv. සිව්පද විරිතේ කැපී පෙනෙන ලක්ෂණයක් ලියන්න.

.......................................................................................................................................

v. ගී විරිතේ නිදහස් බව නිසා ඇතිවන සුවිශේෂත්වයක් දක්වන්න.

.......................................................................................................................................

(ලකුණු 1 X 5 = 5)

(02) පහත දැක්වෙන පද පෙළ ගැන ඇගයීමක් කරන්න. (වචන 100ක් පමණ සෑහේ)

මහ කැලේ මැද්දෙ ලඳු යායකට ගිනි තියන්
කුසගින්න කහටෙටයි රොටියටයි හිර කරන්
පැලක් උඩ හැම රෑම හඳ එක්ක කවි කියන්
උන්දෑ හේනම රැක්කෙ තනි ඇහෙන් නිදි වරන්

හොඬවැලෙන් තඩිබානකොට රෑ
වැටට හයියෙන් තනි එකා
කතරගම දෙවියන් වැඩියෙ නැහැ
අමුඩෙ තෙත බේරෙන තුරා
බැඳපු කදකට අහුවෙච්ච කොට
නොණ්ඩි කකුලට බර දමා
උන්දෑ අලි වෙඩි පත්තු කෙරුවේ
හේන වටටම දුව දුවා

කිරි වැදුණ ළා කරල් යන්තම්
එබෙද්දි හිනහා වෙලා
ගිරවු රෑනට මඟුල් මේසෙකි
පෙනෙන්නේ යායම පුරා
ගිනි අව්වේ ටකරමට තළ තළ
මහ හඬින් බැගිරි තළා
උන්දෑ දවසම හූව තිව්වා
උගුර ලේ රහ වෙන තුරා

තට්ට තනියම මගේ තුරුලත්
පාළු කර හේනට වෙලා
මෙල්ල කර කර්කෂක පොළොවක්
කෝටියක් දා බිඳු හෙළා
පෝය හතරක් වින්ද දුක් කඳ
ගෝනි තිහකට පුරවලා
උන්දෑ තාමත් නිදි මහත්තයො
කොන්දෙ ඇම්මක් කිය කියා

හීනෙකටවත් අපේ එන්නැති
රෝද හතරක දොර ඇරන්
ළඟට විත් මුදු පිරුණු අතකින්
ඉරිඟු කරලක බර මැනන්
එකක් විස්තර තම්බලා දෙන
මගේ දෙස තරහින් බලන්
''ගාණ වැඩි ඇයි'' ඇහුව හින්දයි
ඔච්චා ගැන කිව්වේ මෙමත්

විකුණගෙන මේ කරල් ඔක්කොම
හවස් වෙනකොට කඩේ දුවලා
චීස් හැම් බේකන් පුඩින් නොව
ගෙනියන්නෙ මං මල්ල පුරවා
උදේ තම්බලා ආපු කිරිඅල
දවල්ටත් පොල් එක්ක ගිලලා
පුංචි උන් තුන් දෙනෙක් ඉන්නවා
රෑට බත් ඉල්ලලා අඬනා

සමාවෙන් මේ හැටි කියෙව්වට
ගාණ එච්චර වැඩිම නං
මහත්තයා දැන් යන්න එහෙනම්
මෙන්න මේ කරලත් අරන්
රුපියලක්වත් එපා ඕකට
ඉරිඟු කන්නට මග බලන්
පොඩි එකෙක් ඉන්නවා පේනවා
වාහනේ ළඟ කට ඇරන්

(ලකුණු 10යි)

(03) පද පූරණය කරන්න.

i. සිගිරි පව්ව නැග්ගෙම් හත් වතාවක්
හිනැහී වැලපුනා එක් අප්සරාවක්
..........................................................................................
..........................................................................................

ii. කිරිවැද වී කරල්
..........................................................................................
..........................................................................................
පැහිල නැමුනේ බිමට හැමකල්

iii. හුගක් ඉස්සර රජෙක් හිටියලු රාවණා කියලා
ළදක් දඬුමොණරෙක ගෙනාවලු භාරතේ ඉඳලා
..........................................................................................
..........................................................................................

iv. අපේ ගම මැද පුංචි ඉස්කෝලේ
..........................................................................................
මතක් වෙනවා හිටිය හැටි බාලේ
..........................................................................................

v. ..........................................................................................
..........................................................................................
පුතා රැඳී නිදා සිටින සුමුදු යහන් තලේ
මලක් වගෙයි පිපී වැනෙන අපේ පැතුම් විලේ

(ලකුණු 2 X 5 = 10)

(04) පහත කවි පැනවලට එම විරිතින් ම පිළිතුරු සපයන්න.

i. කැකිරි පැලෙන හිනා නගා කැකුළු වියේ
මිහිරි නැතැත් කියු කවියක් මතක තියේ
වැතිරි ළිඳක කබරගොයෙක් හිටපු පැයේ
ටිකිරි ලියා කළෙත් අරන් මොටද ගියේ?

ii. ලියන්නට කවි සින්දු
කියන විට මන බැන්දු
සිතේ අදහස් රැන්දු
ලියනු කෙලෙසද රසට සින්දු?

iii. වකුගඩු අක්මා දියවෙන පෙනහළු අක්‍රිය කරන
මත්කුඩු මත් ද්‍රව්‍ය බෙදල ජීවිතවල අරුත නසන
රොඩුබොඩු විතරක් නොවේය ජාවාරමේ මුල්ම සිඳින
දරදඩු තව නීති ගේන්නේ කෙසේද රටට ඔබින?

## II කොටස

- (අ) කොටසින් හෝ (ආ) කොටසින් **කැමැති ප්‍රශ්නයක් තෝරා** ගෙන කාව්‍ය නිර්මාණයක් කරන්න.
- සඳැස් පද්‍ය පන්තියක් නම් කවි 6 - 8ක් විය යුතු ය.
- නිසඳැස් පද්‍ය පන්තියක් නම් පේළි 25 - 30 ක් විය යුතු ය.

### (අ) කොටස

(i) ගසක් කපා සැණෙකින් බිම හෙලන්නේ
රැසක් ළපටි පැළ යට වී මියෙන්නේ
සිතක් තියේනම් නෙකවර සිතෙන්නේ
ගසක් නැති හෙටක් කොහොමද දකින්නේ (ගස්වැල් සුරකිමු)

(ii) වලාකුළේ සුදිලෙන දරු මැද රැවින
බලා සිනාසේ අප දෙස සඳ රැජින
වෙලා ගෙන තිබෙන අඳුරින් සිනාසෙන
පලා යයි සිතේ දොම්නස මොහොතකින (සුන්දර රාත්‍රිය)

(ලකුණු 50යි)

### (ආ) කොටස

(i) ජාතික සාහිත්‍ය සම්මාන උළෙලේ දී හොඳම ගේය පද රචකයන් තිදෙනා අතරට ආධුනික ඔබේ ගේය පද රචනය ද නිර්දේශ වී තිබිණි. ''වසරේ හොඳම ගේය පද රචකයා.....'' නිවේදකයා මොහොතකට නිහඬ විය. මේ අවස්ථාවේ දී ඔබේ සිතේ මතු වූ හැඟීම් පැදියෙන් ලියන්න.

(ii) පාසල් දරුවන්ට හොඳ සෞඛ්‍ය පුරුදු පිළිබඳව සඳහන් කරමින්, ලෙඩ රෝගවලින් මිදීමට උපදෙස් දී ඔවුන් දැනුවත් කිරීමට සුදුසු විරිදු පෙළක් නිර්මාණය කරන්න.

(ලකුණු 50යි)


(මුළු ලකුණු 100යි)

iv. යකඩ දම්වල්වලින් පා බැඳ ගමන සන්සුන්
කළේ එහෙමලු
හෙණ්ඩු තුඩගින් තට්ටුලම ඇණ නිතර නිතරම
බය කරනවලු
පෙරහැරේදී පුංචි අය මග දෙපස දැක්කම
ටිකක් නැටුනලු
ඇත් රජ්දෙකුට ඇයි ද හිරිහැර කරන්නේ මට
කියන් යාලු?

v. කොට්ටෝරුවා හැම ගහටම කොටන්නේ
කොට කොට බෙන හදා අත්හැර දමන්නේ
කෙහෙල් ගහට කෙටුදා හොට පැටලෙන්නේ
ඒ මොකදැ යි පහදා මට කියන්නේ?

(ලකුණු 2 x 5 = 10)

(05) පහත දැක්වෙන චිත්‍රය නිරීක්ෂණය කොට කැමති විරිතකින් කාව්‍ය නිර්මාණයක් කරන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න. (සඳැස් නම් පද්‍ය 6 - 8 අතර විය යුතු ය. නිසඳැස්/නිදහස් නිර්මාණයක් නම් පේළි 25 - 30 අතර විය යුතුයි.)



(ලකුණු 10යි)